ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළබැඳි

පුංචි හසුනකට වඩා වැඩි යමක්...

2013 මාර්තු කලාපය



# 1929

# ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය

## හැඳින්වීම



ළමා හිතකාමී ලෝකයක් බිහිකිරීම සඳහා ජාත්‍යන්තරය තුළ වූ දිගුකාලීන සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස 1989 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය සම්මත කරගන්නා ලදී. ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා වූ කැපවීම ප්‍රදර්ශනය කරමින් ශ්‍රී ලංකා රජය විසින් 1991 වර්ෂයේ දී මෙම ප්‍රඥප්තිය පිළිගනිමින් එහි පාර්ශවකරුවකු බවට පත් විය. මෙය 2000 ළමා ආරක්ෂාව සම්බන්දයෙන් වූ සුවිශේෂී අවස්ථාවකිඩ ඒ සමගම ශ්‍රී ලංකාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධව විවිධාකාර ක්‍රියාමාර්ගයන් ගනු ලැබූ අතර, 1998 අංක 50 දරණ පාර්ලිමේන්තු පනතින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය බිහිවන්නේ ඒ අනුව ය.



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පුරා දශකයකට අධික කාලයක් සියලුම ළමයින් සියලුම ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමේ මෙහෙවරෙහි නිරතව සිටින අතර, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ලැබෙන අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් වඩාත් ක්‍රමවත්ව ළමා ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධ උසස් තත්වයන් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී.

උතුරේත් දකුණේත් දරුවන්ගේ හදවත් ස්පර්ශ කළ 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය මෙකී ගමන් මඟ තුළ තීරණාත්මක ඇරඹුමක් විය. 2010 වර්ෂය වන තෙක් ළමා අපයෝජන සම්බන්ධව ළමයින්ට සවන් දීමට සමත්, එකී ප්‍රශ්න සංවේදීව තේරුම්ගැනීමට සමත් සහ යථා තත්වයට පත්වීම සඳහා ළමයින්ට මගපෙන්වීමට සමත් කඩිනම්, විශ්වසනීය හා ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොවුනි. මෙකී රික්තය හඳුනාගත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ සම්බන්ධ ජාත්‍යන්තර අත්දැකීම්ද ප්‍රයෝජනයට ගනිමින් 2010 ජුලි මස 22 දින 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව ජාතික ළමා ආරක්ෂක අධිකාරී පරිශ්‍රයේ දී ස්ථාපිත කරන ලදී.

## 1929 ට පැමිණිලි කළ හැක්කේ කාටද?



1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය වෙත ඕනෑම දරුවෙකුට මෙන්ම, වැඩිහිටියෙකුටද ප්‍රවේශ වී තොරතුරු ලබාදීමේ හැකියාව පවතී. විශේෂයෙන්ම තොරතුරු ලබාදෙන්නා සුරක්ෂිතය. එමෙන්ම මෙම සේවාව ළමා අපයෝජන පිළිබඳව පැමිණිලි කිරීමටම පමණක් සීමාවූවක් නොවේ. උපදේශනය අවශ්‍ය ළමයින් සඳහා මනෝ සමාජ සහයන් ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණයන්ද මෙම අංකය හරහා ලබාදෙන අතර, අවශ්‍ය පුද්ගලයන්ට නීතිමය උපදෙස්ද ලබාගත හැකිවීම විශේෂත්වයකි.

## 1929 පැය 24 පුරාම ක්‍රියාත්මකයි



දවසේ පැය 24 පුරා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ක්‍රියාත්මක මෙම සේවාව වෙත ඕනෑම ජංගම හෝ ස්ථාවර දුරකථනයකින් නොමිලයේ ප්‍රවේශවීමේ හැකියාව පවතී.  ළමා අපයෝජනයක් පිළිබඳව, කඩිනමින් හා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීම මෙමගින් සිදුකෙරේ.මේ හරහා ඇතැම් සැඟවුණු ළමා අපයෝජනයන් පවා අනාවරණය කර ගැනීමට අවස්ථාව උදාවී ඇත. ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු පැමිණිල්ලක් නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය, දිවයිනේ සියළුම පොලිස් ස්ථාන සමඟ සම්බන්ධීකරණය වෙමින් එම අවස්ථාවේදීම සහන සැලසීම සඳහා කටයුතු කිරීම සිදුවේ..

## 1929 පැමිණිල්ලක් ලැබීමෙන් පසු



1929 වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ඉතා කඩිනමින් විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා වූ සුවිශේෂ යාන්ත්‍රණයක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීම පරිදි පොලිස් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ඉල්ලීම පරිදි එවකට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වත්මන් පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් මැතිතුමාගේ මැදිහත්වීම මත 1929 ශ්‍රී ලංකා ළමා  දුරකථන සේවය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සම්බන්ධ උපදෙස් ලබාදෙමින් දිවයිනේ සියලු පොලිස් ස්ථාන වෙත පොලිස් දෙපාර්තමේන්තුව මඟින් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. 1929 වෙත ලැබෙන පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කිරීමෙන් අනතුරුව එවැනි පැමිණිලි සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් සිදුකර පැය 48 ක් ඇතුළත ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත සැපයිය යුතු බවට එමගින් උපදෙස් ලබා දී ඇත.

## 1929 උතුරු, නැගෙනහිර පළාත්වලටද ව්‍යාප්ත කෙරේ.



30 වසරක් පුරා පැවති යුධමය වාතාවරණය නිමවීමෙන් අනතුරුව සංවර්ධනය වෙමින් පවතින උතුරු, නැගෙනහිර පළාත් වල දරුවන්, අපයෝජකයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් රැසක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරමින් සිටියි. ඒ යටතේ "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" එම පළාත් වලට ව්‍යාප්ත කිරීමේ වැඩසටහනක්ද ඇරඹිණි. යාපනය, මුලතිව්, අම්පාර, ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්කවල එම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. මෙහිදී "1929 ශ්‍රී ලංකා ළමා  දුරකථන සේවය" මඟින් දැයේ දරුවන් සඳහා සිදුකරන කාර්යභාරය පිළිබඳව මෙම ප්‍රදේශවල ජනතාව දැනුවත් කරන ලදී.

## 1929 ජාත්‍යන්තරය සමගද එක්වෙයි.



"1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" මේ වන විට ජාත්‍යන්තර ළමා දුරකථන සේවා සංගමය සමගද ඒකාබද්ධව කටයුතු කරමින් සිටියි. ඒ යටතේ ජාත්‍යන්තර ළමා දුරකථන සේවා සංගමයේ තාක්ෂණික දැනුම "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයටද" හිමිවීම විශේෂත්වයකි. මෙහිදී ලොව අනෙකුත්, රටවල්වල ක්‍රියාත්මක ළමා  දුරකථන සේවා සමඟ සිය අත්දැකීම් බෙදාහදා ගැනීමටද ශ්‍රී ලංකා ළමා  දුරකථන සේවයට අවස්ථාව උදාවී තිබේ.

## සභාපතිතුමියගෙන්



දැයේ අනාගත හිමිකරුවන් වන ළමුන්ගේ ආරක්ෂාව, මෙරට සංවර්ධනය තහවුරු කිරීමේදී ප්‍රමුඛ අවශ්‍යතාවකි. එමෙන්ම සංකීර්ණ සමාජ රටාව තුල ළමුන් කෙරෙහි ඇති වී ඇති පීඩනයන් හා අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට හැකි වාතාවරණයක් ගොඩනැගීම සියළු දෙනාගේම වගකීමකි. එම වගකීම සාර්ථකව ඉටුකිරීම සඳහා ජාතික ළමා ආරක්ෂාව අධිකාරියේ අපි කැපවී සිටින්නෙමු.

ශ්‍රී ලංකාව තුළ සිදුවන ළමා අපයෝජන සිදුවීම් ක්ෂණිකව වාර්තා කරගැනීම ක්‍රමවත් කිරීම සඳහා 2010 වර්ෂයේදී අධිකාරිය මගින් "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" ස්ථාපිත කිරීම ළමා ආරක්ෂාවේ සුවිශේෂි සංධිස්ථානයක් ලෙස සඳහන් කළ හැකිය. විශේෂයෙන්ම මෙම ළමා දුරකථන සේවය ආරම්භ කිරීමත් සමඟම රටතුළ සිදුවන ළමා අපයෝජනවල වාර්තාකරණයේ වැඩිවීමක්ද දක්නට ලැබේ. එය සැබවින්ම සතුටුදායක තත්ත්වයකි. මෙම සේවය දිවයින පුරා ප්‍රචලිත කරමින්, දැයේ දරුවන් අපයෝජකයන්ගෙන් ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතම ක්‍රමවේදයක් ලෙස එය භාවිතා කිරීම අපේක්ෂාවයි. එමෙන්ම දිවයිනේ ඕනෑම තැනක සිදුවන ළමා අපයෝජනයක් දුටුවිට "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" අමතන ලෙසද මම ඔබෙන් ඉල්ලා සිටිමි. එය ළමා අපයෝජනයෙන් තොර හෙට දිනක් උදෙසා මහාපිටිවහලක්ද වනු ඇත.

## නියෝජ්‍ය සභාපතිතුමියගෙන්



දැයේ දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අරඹන ලද "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" පිළිබඳ මේ පුවත් හසුන වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයකි. මුළුමහත් දේශයේ දරුවන්ගේ ආරක්ෂාව හා රැකවරණය වඩාත් තහවුරු කිරීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගෙන ඇති මෙම උත්සහය සැබවින්ම දේශයේ උන්නතියටද පිටිවහලක් බව මාගේ විශ්වාසයයි. "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවාව" ළමා ආරක්ෂාව සහ රැකවරණය වෙනුවෙන් සමාජය දැනුවත් කරන්නෙකු ලෙසත් සමාජ ආයතන ලෙස පොලිස්, සෞඛ්‍ය, නීති, අධ්‍යාපන, සන්නිවේදන, ජනමාධ්‍ය, දේශපාලන යන ක්ෂේත්‍ර යා කරමින් ළමා ආරක්ෂණ යාන්ත්‍රණයක් ගොඩනැගීමේ මැදිහත්කරුවකු ලෙසත් ක්‍රියාත්මක වන බව කිව යුතුය.

සමාජයෙන් ඉල්ලා සිටීමට එක් දෙයක් තිබෙන බව සඳහන් කළ යුතුවේ. මෙවන් යාන්ත්‍රණයක් දැයේ දරුවන් වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් අපි දියත් කර ඇති අතර, මෙම මහඟු මෙහෙවරට ඔබේ අනඝි දායකත්වය අපට ලබා දෙන්නේ නම් කෘතඥ වෙමි. එය දරුවන්ගේ යහපත ආරක්ෂාව උදෙසා ඔබෙන් අපට ලැබෙන මහා පිටිවහලක් වනු ඇත එමෙන්ම වගකීමෙන් යුතුව මෙම සේවාව භාවිතා කරණ ලෙසද අපි ඔබෙන් ඉල්ලා සිටිමු

## සංස්කාරක සටහන



දශක තුනකට ආසන්න කාලයක් රටතුළ පැවති යුධමය වතාවරණය හේතුවෙන් ළමයා පළිබඳව හා ළමා අපයෝජන සිද්ධීන් පිළිබඳව සමාජය තුළ පුලුල් කතිකාවතක් සිදුනොවුණි. නමුත් වර්තමාන තත්වය වෙනස්ය.දැන් ළමයා පිළිබඳව වඩාත් විචාරශීලී කතාබහක් ඇතිවී ඇත. ළමා අපයෝජන සිද්ධීන් වාර්තාවීමේ වැඩි ප්‍රවනතාවයක් ද දක්නට ඇත. ඊට බලපා ඇති මූලිකම කාරණය වන්නේ ළමා අපයෝජන සිද්ධින් පිළිබඳව ඇති වී තිබෙන සමාජයමය දැනුවත්භාවයයි. 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය යනු, ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා මෙරට තුළ ස්ථාපිත කර ඇති ප්‍රබලතම ක්‍රමවේදයකි. විශේෂයෙන් ළමා අපයෝජනයන් පිළිබඳව දැනගත් වහාම 1929 ඇමතීම පුරවැසි සැමගේ යුතුකම හා වගකීමයි. දැයේ දරුවන් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා අප ඔබගේ සහය උදක්ම අපේක්ෂා කරමු.

## අප සමගින් එක් වන්න


# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අංක 330,
තලවතුගොඩ පාර,
මාදිවෙල.
දු. අං. - 0112778911-12-14
ෆැක්ස් - 0112778915
www.childprotection.gov.lk
ncpa@childprotection.gov.lk


ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
ChildLine Sri Lanka
1929